ගා/ රිච්මන්ඩ් විද්‍යාලය
අවසාන වාර පරීක්ෂණය - 2018 ජූලි

කාලය පැ 02 යි

**ව්‍යාපාර අධ්‍යයනය I**

❖ **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු ලියන්න.**

01. පහත සඳහන් අවස්ථා අතුරෙන් ව්‍යාපාරික අවස්ථාවක් ලෙස ගත හැක්කේ කුමක්ද?
   i. සමන් තමන්ට අයත්ව තිබූ මෝටර් රථය රුං ලක්ෂ 10 කට වෙනත් පුද්ගලයෙකුට විකිණීම.
   ii. පියා විසින් තම පුත්‍රයාට ඉඩමක් තෑගි ඔප්පුවකින් පවරා දීම.
   iii. මව විසින් සිය දියණියගේ කොණ්ඩය කැපීම.
   iv. බාබර් සාප්පුවක කරණවෑමියා විසින් පාසල් ශිෂ්‍යයෙකුගේ කොණ්ඩය කැපීම.
   v. මව විසින් ගෙවත්තේ වගා කරන ලද එළවළු දිනපතා ආහාරය සඳහා ගැනීම.

02. වෙළඳපොළ යන්න වඩාත් හොඳින් අර්ථ දක්වන ප්‍රකාශය තෝරන්න.
   i. භාණ්ඩ හා සේවා විකුණන ස්ථානයක්.
   ii. යම් භාණ්ඩයක් හෝ සේවයක් අලෙවිකරණ විකුණුම්කරුවන් සමූහයක්.
   iii. ගැණුම්කරුවන් හා විකුණුම්කරුවන් සම්බන්ධ කෙරෙන ඕනෑම අවස්ථාවක්.
   iv. යම් භාණ්ඩයක් හෝ සේවයක් සඳහා වූ ගැනුම්කරුවන් සමූහයක්.
   v. පාරිභෝගික භාණ්ඩ හා සේවා සඳහා වූ ඉල්ලුම හා සැපයුම් තත්වයක්.

03. ව්‍යාපාරයක "බාහිර පරිසර සාධක" පමණක් අන්තර්ගත කාණ්ඩය තෝරන්න.
   i. සංවිධාන සංස්කෘතිය/ තාක්ෂණික පරිසරය / ආර්ථික පරිසරය / ප්‍රජා පරිසරය
   ii. තරඟකරුවෝ/ ගණුදෙනුකරුවෝ/ සේවකයෝ / සංවිධාන සංස්කෘතිය
   iii. ස්වාභාවික පරිසරය/ ප්‍රජා පරිසරය/ සංවිධාන ව්‍යුහය/ සේවකයෝ
   iv. ගනුදෙනුකරුවෝ/ ජනගහනය/ ප්‍රජාව/ තරඟකරුවෝ
   v. සේවකයෝ/ අයිතිකරුවෝ/ කළමනාකරුවෝ/ ගණුදෙනුකරුවෝ

04. පහත සඳහන් වන්නේ ව්‍යාපාර විසින් ඉටුකරනු ලබන සමාජ වගකීම කිහිපයකි.
   a) බදු ගෙවීම නොපිරිහෙලා ඉටුකිරිම.
   b) ආර්ථික ප්‍රතිලාභ අත්කර දීම.
   c) වෘත්තීමය ආරක්ෂාව සැලසීම.
   d) හරිත නිෂ්පාදන බිහිකිරීම.
   e) ගුණත්වයෙන් යුතු භාණ්ඩ සැපයීම.
   f) ප්‍රජා සත්කාරක සේවා
   g) භාණ්ඩ හා සේවා පිළිබඳ නිවැරදි තොරතුරු ලබාදීම.

   සමාජය කෙරෙහි ව්‍යාපාර ඉටුකරන සමාජ වගකීම් අඩංගු පිළිතුර වන්නේ,

   1. a, b, c    2. a, b, e    3. d, e, f    4. a, d, f    5. d, f, g

05. නිමාලි ගාල්ලේ සිටින සිය නැන්දනිය බැලීමට කොළඹ සිට ගාල්ල දක්වා දිවෙන අධිවේගී මාර්ග සුඛෝපභෝගී බස්රථයකට ගොඩවිය. ඒ යන අතරතුර සුපර් මාර්කට් එකෙන් මිලදී ගත් පලතුරු මිශ්‍ර යෝගට් එකක් ආහාරයට ගැනීමට සැරසුනු ඇය එහි කෑමට පෙර දිනය පරීක්ෂා කළාය. එහිදී ඇයට දැකගන්නට ලැබුණේ එම යෝගට් එක කල් ඉකුත් වී ඇති බවයි. බස් රථය මග ඇරේ යැයි ඇති බිය නිසා ඉතා හදිස්සියෙන් එය මිලදී ගත් නිසා ඇයට එය පරීක්ෂා කිරීමට නොහැකි වූ බව ඇයට සිහි විය.

♣ ඉහත සිදුවීමෙන් නිමාලි විසින් කඩකල පාරිභෝගික වගකීම වන්නේ,

i. සමාජය ගැන සැලකිලිමත් නොවීම.
ii. පරිසරය පිළිබඳ සැලකිලිමත් නොවීම.
iii. සක්‍රිය සහභාගීත්වය
iv. සහයෝගීතාවය
v. විචාරාත්මක දැනුවත්භාවය

06. පහත සඳහන් වන්නේ ව්‍යාපාර සම්බන්ධ ප්‍රකාශ කීපයකි.

a) කළමනාකරණ තීරණ ගනු ලබනුයේ අයිතිකරු විසින් වීම.
b) ලාභ බෙදාගැනීම සඳහා වූ යම් එකඟතාවයක් දැක්විය හැකිවීම.
c) කොටස් හා වෙනත් සුරැකුම්පත් ප්‍රසිද්ධියේ නිකුත් කළ හැකිවීම.
d) ලියාපදිංචිය අනිවාර්ය නොවීම.
e) අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම.
f) ප්‍රාග්ධනය වෙනුවෙන් පොළියක් කිසිම හවුල්කරුවෙකුට හිමි නොවේ.

ඉහත ප්‍රකාශ අතුරෙන් කේවල ස්වාමි ව්‍යාපාර වලට පමණක් අදාල ප්‍රකාශ වන්නේ,

1. a, b,c 2. a,d e 3. b,c,e 4.a,e,f 5. c,d,e

07. ඇපයෙන් සීමිත සමාගම් සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

i. කොටස් ප්‍රසිද්ධියේ නිකුත් කිරීමට අවසර ඇත.
ii. ලාභය සහ සමාජ සුභ සාධනය ප්‍රධාන අරමුණ වේ.
iii. සමාගමේ ලාභ බෙදාහැරීම සිදුනොකරයි.
iv. අවම සාමාජික සංඛ්‍යාව 01 කි.
v. උපරිම සාමාජික සංඛ්‍යාව 50 කි.

08. පහත දැක්වෙන සීමාසහිත පොදු සමාගමක සාමාන්‍ය කොටස් හිමියෙකුගේ අයිතිවාසිකම් හා යුතුකම් කිහිපයකි.

a) රැස්වීම්වලදී යෝජනා ඉදිරිපත් කිරීම.
b) සමාගමේ කටයුතු ගැන සැලකිලිමත් වීම.
c) රැස්වීම්වලට නිසි පරිදි සහභාගී වීම.
d) ලාභාංශ ප්‍රකාශ කර නොමැති විටක එය ඉල්ලා ගැනීම.
e) ඡන්දය පාවිච්චි කිරීම.

ඉහත කරුණු අතුරෙන් සාමාන්‍ය කොටස් හිමියෙකුගේ යුතුකම් ලෙස සඳහන්ව ඇත්තේ,

1. a සහ e 2. d පමණි 3. a, b සහ e 4. b සහ d 5. b, c සහ d

09. ව්‍යවසායකත්වය සංවර්ධනයට බාධා කෙරෙන අභියෝගයක් ලෙස සැලකිය හැක්කේ,

1. දෛවය 2. මුදල් 3. පරිසරය 4. තොරතුරු 5. දැනුම


10.

- ජයතිස්ස සිය පියාගෙන් උරුම වූ කර්මාන්ත ශාලාව නව යන්ත්‍ර සූත්‍ර යොදා පුළුල් කර පවත්වාගෙන යයි.
- දේවක විදේශ රැකියාවකින් උපයාගත් මුදල් යොදා සංචාරක හෝටලයක් බවට අරඹා පවත්වාගෙන යයි.
- සංජු තම සාම්ප්‍රදායික සිල්ලර වෙළඳසැල සුපිරි වෙළඳසැලක් බවට පරිවර්තනය කර පවත්වාගෙන යයි.
- කසුන් ඔහුගේම වට්ටෝරුවක් අනුව පරිසර හිතකාමී මදුරුනාශකයක් නිපදවා වෙළඳපොලට බෙදා හැරීම.
- නිසල් විදේශ රටක නිපදවූ සූර්ය ශක්තියෙන් ක්‍රියාකරන විදුලි බල්බයක් පේටන්ට් අයිතිය මිලට ගෙන එය නිපදවා දේශීය වෙළඳපොළට අලෙවිකරයි.

ඉහත සඳහන් අය අතුරෙන් ව්‍යවසායකයෙකු ලෙස සැලකිය හැක්කේ,

1. ජයන්ත 2. දේවක 3. සංජු 4. කසුන් 5. නිසල්

11. පවිරන්නාට ඇති හිමිකමට වඩා හොඳ හිමිකමක් පාවරුම්ලාභියාට නොලැබෙන බව තහවුරු කරමින් චෙක්පතට ඇතුලත් කළ හැකි රේඛනය වනුයේ,




12. ජීවිත රක්ෂණය ඇතුළුව සියලුම රක්ෂණවලට අදාල රක්ෂණ මූලධර්ම ඇතුළත් කාණ්ඩය වනුයේ,

    i. උපරිම විශ්වාසය/ දායකය / ආසන්නතම හේතුව
    ii. ආසන්නතම හේතුව/ හානි පූර්ණය/ දායකය
    iii. රක්ෂණ හිමිකම / උපරිම විශ්වාසය/ ආසන්නතම හේතුව
    iv. ආදේශනය/ දායකය/ උපරිම විශ්වාසය
    v. උපරිම විශ්වාසය/ රක්ෂණ හිමිකම/ ආදේශනය

13. පහත දැක්වෙන්නේ ප්‍රවාහනය හා සම්බන්ධ කරුණු කිහිපයකි.

| A | B |
|---|---|
| 1. මාර්ගය | a. ඛනිජ තෙල්, විදුලිය, ගෑස් |
| 2. මාධ්‍යය | b. ජලමාර්ගය, මහා මාර්ගය, දුම්රිය මාර්ග |
| 3. බලය | c. බස්නැවතුම්පොල, දුම්රිය මාර්ග, වරාය |
| 4. පර්යන්තය | d. ලොරි, වෑන්, බෝට්ටු, දුම්රිය |

ඉහත A හා B පිළිවෙලින් ගැලපූ විට නිවැරදි පිළිතුර වන්නේ.

i. 1- a, 2-b, 3-c, 4-d
ii. 1- b, 2-c, 3-d, 4-a
iii. 1- b, 2-d, 3-a, 4-c
iv. 1- b, 2-d, 3-c, 4-a
v. 1- c, 2-d, 3-e, 4-a

14. පහත දක්වෙන්නේ ප්‍රවාහනයේදී භාවිතා වන ලියකියවිල කීපයක් සහ ප්‍රවාහන ක්‍රම කිහිපයකි.

| A | B |
|---|---|
| 1. භාණ්ඩ ප්‍රවාහනයේදී - මහා මාර්ගය | a. නිදහස් ගමන් බලපත්‍රය |
| 2. මගීන් ප්‍රවාහනය - මුහුදු මාර්ග | b. ගුවන් මාර්ග බිල්පත |
| 3. භාණ්ඩ ප්‍රවාහනය - ගුවන් මාර්ග | c. භාරදීමේ තුණ්ඩුව |
| 4. මගීන් ප්‍රවාහනය - දුම්රිය මාර්ග | d. නැව් ප්‍රවේශ පත්‍රය |

a සහ B පිළිවෙලින් ගැලපූ විට,

i. 1- a, 2-b, 3-c, 4-d　　ii. 1- c, 2-d, 3-b, 4-a　　iii. 1- a, 2-b, 3-d, 4-c
iv. 1- d, 2-a, 3-b, 4-c　　v.1- b, 2-c, 3-d, 4-a

15. උපකාරක සේවාවක් ලෙස සැලකිය නොහැක්කේ.

i. තොග වෙළඳාම　　ii. සන්නිවේදනය　　iii. ප්‍රවාහනය　　iv. රක්ෂණය

16.

- ♣ තැන්පතු භාර ගනී.
- ♣ විදේශ විනිමය ගනුදෙනු වල නිරත නොවේ.
- ♣ ණය දීම සිදුවේ.

ඉහත ලක්ෂණ සහිත මූල්‍ය ආයතනය කුමන නමකින් හැඳින්වේද?

1. බලපත්‍රලාභි වාණිජ බැංකු　　2. බලපත්‍රලාභී විශේෂිත බැංකු
3. ලියාපදිංචි මූල්‍ය සමාගම්　　4. කල් බදු සමාගම්
5. කොටස් හැරවිකාර සමාගම්

17. පහත ප්‍රකාශ අතුරෙන් සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

i. ආයතනයේ අරමුණු හා පරමාර්ථ ළඟාකර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු වලට පුද්ගලයන් නිරත කරවීම කෙරෙහි බලපෑම් කිරීමේ හා අභිප්‍රේරණය කිරීමේ ක්‍රියාවලිය මෙහෙයවීම වේ.
ii. අරමුණු හා පරමාර්ථ ඉටුකර ගැනීමේදී සම්පත් නාස්තියකින් තොරව භාවිතා කිරීමේ කාර්යක්ෂමතාව වේ.
iii. අන් අය ලවා වැඩකරවා ගැනීමේ කලාව කළමනාකරණය වේ.
iv. සංවිධානයක ඉලක්ක සහ එම ඉලක්ක සපුරා ගැනීම සඳහා කළ යුතු උපාය මාර්ග අන්තර්ගත ලේඛනය සැලැස්ම වේ.
v. ආයතනයක කාර්යයන් තුළ දැකිය හැකි පොදු ලක්ෂණ උපයෝගී කරගෙන රැකියා කාණ්ඩගත කිරීමේ ක්‍රියාවලිය ශ්‍රම විභජනය වේ.

18. PQRS යන ව්‍යාපාර වල වර්තමාන තත්ත්වය පහත සඳහන් රූප සටහනේන පෙන්නුම් කරයි.

| | සඵලදායී | සඵලදායී නොවන |
|---|---|---|
| කාර්යක්ෂම | Q | S |
| අකාර්යක්ෂම | R | P |

ඉහත රූප සටහනට අදාලව ව්‍යාපරය තත්ත්වයන් නිවැරදිව දක්වා ඇති පිළිතුර තෝරන්න.

i. P ව්‍යාපාර පැවැත්ම තහවුරු වී ඇත.
ii. Q සතු ව්‍යාපාරයෙන් වේගයෙන් වර්ධනය වන අතර පැවැත්ම තහවුරු වී ඇත.
iii. P සහ R ව්‍යාපාර ඉතා සෙමින් වර්ධනය වී ඇත.

iv. S ව්‍යාපාර විනාශ වීම කරා සෙමින් ගමන් කරයි.

v. P ව්‍යාපාරය පැවැත්ම තහවුරු වී ඇති අතර ව්‍යාපාරය විනාශ වීම කරා සෙමින් ගමන් කරයි.

19. පහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

i. ආයතනයක කටයුතු සම්බන්ධීකරණය කිරීමේදී මෙන්ම ගැටලු විසඳීමේදී විවිධ දෙපාර්තමේන්තු අතර විවිධ වැඩසටහන් කණ්ඩායම් අතර, සමාන මට්ටමේ තනතුරු අතර සිදුවන සන්නිවේදනය තිරස් සන්නිවේදනය වේ.

ii. නිෂ්පාදන ක්‍රියාවලිය, අවශ්‍ය යන්ත්‍රාගාර හා යන්ත්‍ර උපකරණ, නිෂ්පාදන කාලසටහන්, අවශ්‍ය ද්‍රව්‍ය, අවශ්‍ය ද්‍රව්‍ය වල ප්‍රමාණය හා ගුණය යනාදිය තීරණය කිරීම, නිෂ්පාදන සැලසුම්කරණය වේ.

iii. නිෂ්පාදන ක්‍රියාවලියේදී එක සමාන යන්ත්‍ර හා විෂම යන්ත්‍ර වෙන වෙනම කුටි වල සවිකර නිෂ්පාදන කටයුතු ගලායන ආකාරයට සිදුකිරීම සඳහා පිරියත සැලසුම් කිරීම ස්ථාවර ස්ථානීය පිරියත ලෙස හැඳින්වේ.

iv. තොගයෙහි ඇතිවන වෙනස් වීම් එවෙලෙහිම වාර්තා කරන ඕනෑම අවස්ථාවක ගබඩාවේ තිබෙන ශේෂය දැනගත හැකි ආකාරයට තොග වාර්තා කිරීම තොග පාලනය වේ.

v. ආයතනයක තනතුරු කාර්ය බලතල, වගකීම්, වගවීම යනාදිය බෙදී ගොස් ඇති ආකාරය හා සමායෝජනය වී ඇති ආකාරය බලතල මධ්‍යගතකරණය වේ.

20. පහත සඳහන් වන්නේ මූල්‍යමය හා මූල්‍යමය නොවන අභිප්‍රේරණය ක්‍රම කිහිපයකි.

a) සේවකයින් පුහුණු කිරීම.

b) ණය පහසුකම් ලබාදීම.

c) උසස් වීම් ලබාදීම.

d) ප්‍රසාද දීමනා ලබාදීම

e) යෝග්‍ය වැඩ පරිසරයක් ඇති කිරීම.

f) ආයතනයේ නිෂ්පාදිත සහන මිලට ලබාදීම.

ඉහත අභිප්‍රේරණ ක්‍රම අතුරෙන් මූල්‍යමය අභිප්‍රේරණය ක්‍රම පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,

i. abc ii. bdf iii. def iv. bde v. aef

21. සංවිධාන ධුරාවලියේ ඉහළ මට්ටම්වල සිටින කළමනාකරුවන්ගේ සිට පහළ මට්ටම් වල සිටින කළමනාකරුවන් හෝ යටත් සේවකයන් දක්වා යමක් කරන සන්නිවේදනය හඳුන්වනුයේ,

i. තිරස් සන්නිවේදනය

ii. විධිමත් සන්නිවේදනය

iii. සිරස් සන්නිවේදනය

iv. ඉහළ සිට පහළට සන්නිවේදනය

v. පහළ සිට ඉහළට සන්නිවේදනය

22. ව්‍යාපාරයක එක්තරා නිෂ්පාදිතයකට අදාලව වාර්ෂික අය වැය තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

| | |
|---|---|
| විකුණුම් ඒකක | 20000 |
| ඒකකයක විකුණුම් මිල රු. | 100/- |
| ඒකක පිරිවැය (රුපියල්) | |
| සෘජු ද්‍රව්‍ය පිරිවැය | 40/- |
| සෘජු ශ්‍රම පිරිවැය | 20/- |
| විචල්‍ය පොදු කාර්ය පිරිවැය | 20/- |

| | |
|---|---|
| ස්ථාවර පොදු කාර්ය පිරිවැය | 10/- |
| | 90/- |

ඉහත නිෂ්පාදිතයේ සමච්ඡේදන ඒකක ප්‍රමාණය වනුයේ,

i. ඒකක 20,000
ii. ඒකක 16000
iii. ඒකක 10,000
iv. ඒකක 5000
v. ඒකක 2500

23. අලෙවිකරණ මිශ්‍රණයේ විචල්‍යන් හා සම්බන්ධ සාධක කිහිපයක් පහත දැක්වේ.

A- සන්නම
B- ආවරණය
C- ප්‍රවාරණය
D- සෘජු අලෙවිකරණය
E- දීමනා
F- මහජන සම්බන්ධතා
G- පෞද්ගලික අලෙවිය

ඉහත සාධක වලින් ප්‍රවර්ධන මිශ්‍රයට ඇතුළත් සාධක පමණක් ඇතුළත් පිළිතුර කුමක්ද?

i. C D F G    ii. A C E F    iii. C D A F    iv. A D F G    v. A B E F

24. ව්‍යාපාරයක මූල්‍ය කළමනාකරණය හා බැඳි තීරණ කිහිපයක් පහත දැකිවේ. ඒවායින් මූල්‍යන තීරණ පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.

A. වෙළඳ ණය හිමියන් පිළිබඳ තීරණ
B. ණය ගැතියන් පිළිබඳ තීරණ
C. ලාභාංශය විභජනය පිළිබඳ තීරණ
D. ව්‍යාපාර නවීකරණය පිළිබඳ තීරණ
E. ණය ප්‍රාග්ධනය ලබාගැනීම පිළිබඳ තීරණ
F. ගෙවිය යුතු වියදම පිළිබඳ තීරණ

i. A B C D    ii. A C E F    iii. A C D F    iv. B D E F    v. B C D F

25. මූල්‍ය කළමනාකරණයේදී අවශ්‍ය වන තොරතුරු ලබාගැනීමට අදාළ මූල්‍ය ප්‍රකාශය වන්නේ,

i. ශේෂ පත්‍රය, වෙළඳ ගිණුම, මුදල් ප්‍රවාහන ප්‍රකාශය
ii. ආදායම් ප්‍රකාශය, මුදල් අයවැය ලේඛනය, ශේෂ පත්‍රය
iii. වෙළඳ ගිණුම, ශේෂ පත්‍රය, ආදායම් ප්‍රකාශය
iv. ශේෂ පත්‍රය, ආදායම් ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය
v. මුදල් අය වැය ලේඛනය, ශේෂ පත්‍රය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය

26. පහත සඳහන් වන්නේ ව්‍යාපාරයක් විසින් ගනු ලබන ආයෝජන තීරණ කිහිපයකි.

a) වෙළඳ තොගය පිළිබඳ තීරණ
b) ව්‍යාපාර වැඩිදියුණු කිරීමේ තීරණ
c) වෙළඳ ණය ගැතියෝ පිළිබඳ තීරණ
d) ව්‍යාවහාරය නවීකරණය කිරීමේ තීරණ
e) කෙටිකාලීන ආයෝජන තීරණ

ඉහත තීරණ අතුරෙන් කෙටි කාලීන ආයෝජන තීරණ පමණක් ඇතළත් පිළිතුර තෝරන්න.

i. a b c    ii. a c e    iii. b c d    iv. c d e    v. a c d

27. ඒකියා පිරිවිතරයක අඩංගු කරුණක් වන්නේ,
1. ඒකියාවට අයත් කාර්ය
2. ඒකියාවේ යුතුකම්
3. ඒකියාවේ වගකීම්
4. ඒකියාවට අයත් සේවා කොන්දේසි
5. ඒකියාව දරන්නාගේ සුදුසුකම්

28. නිමල් සිය තනතුරෙහි පරිවාස කාලය තුල සිය කටයුතු නිසියාකාරව ඉටු නොකල බව කළමනාකරණය වෙත වාර්තා වී ඇති අතර ඔහුගේ පරිවාස කාලය අවසන් වීමට ආසන්න බවත්, තනතුර ස්ථිර කිරීම පිලිබඳව තීරණය හෝ වෙනත් ක්‍රියාමාර්ගයක් තම වෙත දැනුම් දෙන්න යැයි අදාල අංශය වෙතින් මානව සම්පත් කළමනාකරු වන ඔබගෙන් ඉල්ලා සිටී. පහත සඳහන් තීරණ වලින් වාඩ සුදුසු තීරණ කුමක්ද?
1. සේවයෙන් පහ කිරීම
2. සේවය ස්ථිර කිරීම
3. වැටුප් අත්හිටුවීම
4. කාර්යඵල ඇගයීම
5. පුහුණුව සඳහා යොමුකරවීම

29. පහත සඳහන් වන්නේ භාවිතය අනුව තොරතුරු පද්ධති වර්ගීකරණ හා ඒවා උපකාරී කර ගන්නා පුද්ගලයන් ය.

| A තොරතුරු පද්ධති | B භාවිත කරන පුද්ගලයින් |
|---|---|
| 1. දැනුම් කාර්ය පද්ධති<br>2. කාර්යාල ස්වයංකරණ පද්ධති<br>3. කළමනාකරණ තොරතුරු පද්ධති<br>4. විධායක උපකාරක පද්ධති | a) ලිපිකරුවන්, ගිණුම්සහකරුවන්<br>b) අග්‍රමට්ටමේ කළමනාකරුවන්<br>c) ඉංජිනේරුවරුන්, පර්යේෂකයින්<br>d) මධ්‍යම මට්ටමේ කළමනාකරුවන් |

ඉහත A හා B ගැලපූ විට නිවැරදි පිළිතුර වන්නේ,

i. 1- a, 2-b, 3-c, 4-d
ii. 1- c, 2-a, 3-d, 4-b
iii. 1- c, 2-a, 3-b, 4-d
iv. 1- c, 2-d, 3-b, 4-a
v. 1- d, 2-a, 3-c, 4-b

30. ව්‍යාපාර සැලැස්මක ව්‍යාපාරය කුමක්ද යන්න හා ව්‍යාපාරය සපයනු ලබන භාණ්ඩය හෝ සේවාව පිළබඳ විස්තරයක් එමගින් ගනුදෙනුකරුවන්ට ලැබෙන ප්‍රතිලාභන් එහි, සුවිශේෂීත්වයන් සඳහන් වන්නේ,
1. විධායක සාරාංශයේය
2. අලෙවි සැලැස්මේ ය
3. ව්‍යාපාර විස්තරයේය
4. මෙහෙයුම් සැලැස්මේය
5. මානව සම්පත් සැලැස්මේය

31. i.) පාරිභෝගික භාණ්ඩ හා ව්‍යාපාරික භාණ්ඩ යනුවෙන් භාණ්ඩ වර්ග කරනුයේ, ........................................................ මතයි.

ii.) රටක ආර්ථික ස්ථායීතාවය ආරක්ෂා කර ගැනීම ........................................... අරමුණ වන අතර රටක දීර්ඝකාලයක් පුරා මිළ මට්ටම් ස්ථාවරව පවත්වාගෙන යාම ........................................................................ ප්‍රධාන අරමුණයි.

32. i.) මූල්‍ය ප්‍රතිපත්තය ක්‍රියාත්මක කිරීම සඳහා මහ බැංකුව භාවිතා කරන පොලී අනුපාතිකය ................................................ ලෙස හඳුන්වයි.

ii.) වරලත් ව්‍යාපාර අතුරින් K.F.C, Mc Donald, ........................................................................................ කි.

33. i.) රාජ්‍ය සංස්ථා .............................................................. හෝ ...................................................... යටතේ සංස්ථාපනය කළ හැක.

ii.) ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව කුඩා ව්‍යාපාර ලෙස නිර්වචනය කරනුයේ ...................................................... ව්‍යාපාරයි.

34. i.) ශ්‍රී ලංකා මූල්‍ය ආයතන වර්ගීකරණයට අනුව කොටස් තැරැවුකාර සමාගම් ................................ යටතය ගැනේ.

ii.) රක්ෂණයේදී රක්ෂණ සමාගම් වල වගකීම් විතැන්කිරීමට මෙන්ම රක්ෂිතයාගේ වාරිකය අඩුමට්ටමකට හැකියාව පවතින්නේ ...................................................... නිසාය.

35. එක් නිෂ්පාදකයෙකුගේ භාණ්ඩ පමණක් අලෙවි කිරීමට ගිවිසුම් වලට එළඹි වෙළඳසැල් ...................................................... යනුවෙන් හැඳින්වෙන අතර එක් නිෂ්පාදකයෙකුගේ භාණ්ඩ රටපුරා ශාඛා වෙළඳසැල් පවත්වාගෙන යමින් එකිනෙක සිදුකරන ව්‍යාපාර ............................ ............................................ යනුවෙන් හඳුන්වයි.

36. i.) සංවිධානයක පරිසරය පිළිබඳව ඇති අවබෝධය, ගැටළු තේරුම් ගැනීමේ හැකියාව හා විසඳීමේ හැකියාව කළමනාකරුවෙකු සතු ...................................................... යටතට ගැනේ.

ii.) සංවිධානකරණයේදී ආයතනයක ඉලක්ක ළඟාකරගැනීම සඳහා ඒ ඒ අංශ වල කාර්යයන් හා පරමාර්ථ ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලිය ...................................................... යනුවෙන් හැඳින්වේ.

37. නිෂ්පාදනයේදී පය ආරම්භයේ සිට අවසානය දක්වාම එකම අයිතමයක් නිෂ්පාදනය කිරීම ...................................................... වන අතර එකම වර්ගයේ භාණ්ඩයක් අඛණ්ඩව විශාල ප්‍රමාණයකින් නිෂ්පාදනය කිරීම ...................................................... යනුවෙන් හඳුන්වයි.

38. i.) ව්‍යවසායකයෙකු තම භාණ්ඩ හා සේවා අලෙවි කිරීමට අපේක්ෂා කරනු ලබන පාරිභෝගික කණ්ඩායම ...................................................... යනුවෙන් හඳුන්වයි.

ii.) සාකල්‍යවාදී අලෙවිකරණ සංකල්පයේ ආරම්භය ................................ වන අතර එමගින් අවධානය යොමු කරන්නේ ...................................................... අපේක්ෂාවන් ඉටු කිරීම සඳහායි.

39. ව්‍යාපාරයක් තම අරමුදල් වත්කම් වල ආයෝජනයෙන් හා ඒවායින් ජනිත කරන ඉපයීම් අතර ඇති සම්බන්ධතාව පෙන්නුම් කරන අනුපාතයක් වන්නේ, ......................................................

40. කළමනාකරුවන් විසින් තොරතුරු භාවිතයේදී අනු කළමණාකරුවන් ........................................ තොරතුරු භාවිතා කරන අතර පළමුපෙළ කළමනාකරුවන් ................................ තොරතුරු භාවිතා කරයි.

❖ **හිස්තැන් පුරවන්න.**

41. ව්‍යාපාර සමාජ වගකීම් ඉටුකල යුතු ප්‍රධාන පාර්ශව 04 නම්,

1. ......................................................  2. ......................................................

3. ......................................................  4. ......................................................

42. හවුල්කරුවන් විසින් ඉටුකළ යුතු යුතුකම් 04 ක් දක්වන්න.

1. ............................................................ 2. ............................................................

3. ............................................................ 4. ............................................................

43. වාණිජ බැංකු විසින් පවත්වාගෙන තැන්පතු වර්ග 03 නම්.

1. .................................................. 2. .................................................. 3. ..................................................

44. රක්ෂණය කළ හැකි අවදානම් වල ලක්ෂණ නම්,

1. ............................................................ 2. ............................................................

3. ............................................................ 4. ............................................................

45. විද්‍යුත් වෙළඳාමේ ක්‍රියාපටිපාටිය පිලිවෙලින් දක්වූ විට,

1. ............................................................ 2. ............................................................

3. ............................................................ 4. ............................................................

46. Henry Mintyberg ගේ කළමණාකරණ භූමිකා වලට අනුව තීරණ භූමිකා යටතට ගැනෙන උප භූමිකා නම් කරන්න.

1. ............................................................ 2. ............................................................

3. ............................................................ 4. ............................................................

47. පාලනය සඳහා භාවිතා කරන පාලන විධි නම් කරන්න

1. ............................................................ 2. ............................................................

3. ............................................................ 4. ............................................................

48. භාණ්ඩයේ ගුණාත්වය තීරණය කිරීමට බලපාන අංගෝපාංග මොනවාද?

1. ............................................................ 2. ............................................................

3. ............................................................ 4. ............................................................

49. මූල්‍ය වෙළඳපොළේ සංයුතිය දක්වන්න.

1. ............................................................ 2. ............................................................

3. ............................................................ 4. ............................................................

50. සේවකයින් චලනය කළහැකි ක්‍රම 04 ක් දක්වන්න.

1. ............................................................ 2. ............................................................

3. ............................................................ 4. ............................................................

## ගා/ රිච්මන්ඩ් විද්‍යාලය
## අවසාන වාර පරීක්ෂණය 2018 ජුලි

**ව්‍යාපාර අධ්‍යයනය II** | **කාලය පැ 03 යි**

***උපදෙස් :- එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙක බැගින්වත් තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.***

### I කොටස

(1) (i) (අ) ලාභ අරමුණින් තොරව පවත්වාගෙන යන ව්‍යාපාර ද දැකිය හැක. ඒ අනුව ව්‍යාපාර යන්න හඳුන්වන්න.

(ආ) ආහාර, සෞඛ්‍යය, ආරක්ෂාව යනාදිය අවශ්‍යතා යනුවෙන් හැඳින්වෙන්නේ මන්දැයි සඳහන් කරන්න.

(ii) (අ) ව්‍යාපාරයක ලක්ෂණයක් වනුයේ විකුණුම් හෝ හුවමාරුවක් සිදුවීමයි. මෙය කෙටියෙන් පැහැදිලි කොට ඊට උදාහරණයක් දක්වන්න.

(ආ) ව්‍යාපාරයක දැකිය හැකි ප්‍රධාන කටයුතු දෙක නම් කරන්න.

(iii) ව්‍යාපාර කාර්යයන් නම් කොට එම කාර්යයන් සඳහා නිමි ඇඳුම් කර්මාන්ත ශාලාවක් ඇසුරින් උදාහරණ දෙක බැගින් නම් කරන්න.

(iv) (අ) අභ්‍යන්තර පරිසර සාධකයක් වන සංවිධානමය සංස්කෘතිය යන්න හඳුන්වා එමගින් අප පාසලට ලබා දී ඇති ශක්තීන් නම් කරන්න.

(ආ) පහත සඳහන් බලවේග කුමන සාර්ව පරිසර බලවේගයකට අයත් වේද යන්න දක්වා ඉන් ව්‍යාපාරවලට සිදුවන අවස්ථා හෝ තර්ජන නම් කරන්න.

(A) ජනගහනය වැඩිවීම.

(B) පොළී අනුපාතය අඩුවීම.

(v) (අ) ව්‍යාපාරයක් විසින් තම අයිතිකරුවන් වෙත ඉටුකළ යුතු සමාජ වගකීමක් වන්නේ ආර්ථික ප්‍රතිලාභ අත්පත් කර දීමයි. එසේ අත්කර දිය හැකි ආර්ථික ප්‍රතිලාභ මොනවාද?

(ආ) ව්‍යාපාර ආචාරධර්ම පිළිපැදීම මගින් ව්‍යාපාරයකට අත්පත් කරගත හැකි වාසි මොනවාද?

(2) (i) (අ) ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාර කෙරෙහි රාජ්‍ය බලපෑම ආකාර තුනකට ක්‍රියාත්මක වේ. එය නම් කොට පහත සඳහන් අවස්ථා සඳහා එම ආකාරයන් දායකවන අයුරු සඳහන් කරන්න.

- ★ යටිතල පහසුකම් සැපයීම.
- ★ බදු අයකරන්නෙකු වීම.

(ආ) රටක රජයක් විසින් ව්‍යාපාර සඳහා විවිධාකාරයේ දිරිගැන්වීම් ලබාදෙමින් එය වැඩිදියුණු කිරීමට කටයුතු කරනුයේ ඇයිදැයි යන්න දක්වා ඊට බලපාන ලද හේතු සඳහන් කරන්න.

(ii) (අ) පිස්කල් ප්‍රතිපත්තියේ ප්‍රධාන අරමුණ සාර්ව ආර්ථික ස්ථායීතාවය ආරක්‍ෂා කර ගැනීමයි. මෙය ව්‍යාපාරවලට බලපාන ආකාරය සඳහා උදාහරණ දෙකක් දක්වන්න.

(ආ) පාරිභෝගිකයෙකු වෙළෙඳපොළක් තුළ තාර්කික පාරිභෝගිකයෙකු ලෙස හැසිරීම සඳහා දැනගත යුතු තත්වයන් 4 ක් නම් කරන්න.

(iii) (අ) 2007 අංක 07 දරණ සමාගම් පනත මගින් එක් පුද්ගලයෙකුට තනිව උවද සමාගමක් ඇරඹිය හැක. එසේ තනිව සමාගමක් ඇරඹීම තුළ ඔහුට හිමිවන වාසි හා අවාසි 02 බැගින් සඳහන් කරන්න.

(ආ) හවුල් ව්‍යාපාරයක් ඇරඹීමේදී වඩාත් යෝග්‍ය වන්නේ ලිඛිත ගිවිසුමක් මත හවුලක් ඇරඹීමයි. එවැනි ලිඛිත ගිවිසුමක් හවුල්කරුවන්ට වැදගත්වන අවස්ථා මොනවාදැයි දක්වන්න.

(iv) (අ) විවිධ ආයතනවල මුදල් තැන්පත් කොට එම මුදල් ආපසු නොලැබුණු තැන්පතුකරුවන් කරනු ලබන උද්ඝෝෂණයක් දුටු ඔබගේ ගමේ සිල්ලර වෙළෙන්දෙකු ඉතිරි කිරීමේ ගිණුමක් ආරම්භ කිරීමට වඩාත් යෝග්‍ය මූල්‍ය ආයතනයක් කුමක්දැයි ඔබගෙන් විමසයි. මේ සඳහා ඔබ ඔහුට ලබාදෙන උපදෙස් කෙටියෙන් සඳහන් කරන්න.

(ආ) අනෙකුත් සමාගම්වලට සාපේක්‍ෂව ඇපයෙන් සීමිත සමාගමක දැකිය හැකි සුවිශේෂී ලක්‍ෂණ 4 ක් සඳහන් කරන්න.

(v) (අ) "සමාගමක් පාලනය කිරීම සඳහා අවශ්‍ය මණ්ඩලය එහි කොටස්කරුවන්ගේ ඡන්දයෙන් තෝරා පත්කර ගත්තද එහි ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් දැකිය නොහැක" මෙය සත්‍යද අසත්‍ය ද යන්න දක්වා ඊට හේතු දක්වන්න.

(ආ) කුමන අර්ථ ක්‍රමයක් පවත්වාගෙන ගියද ලෝකයේ සෑම රටකම පොදු අංශයේ ව්‍යාපාර දැකිය හැක. එසේ පොදු අංශයේ ව්‍යාපාර පවත්වාගෙන යාමට බලපාන කරුණු 4 ක් සඳහන් කරන්න.

(3) (i) (අ) සියලු ව්‍යවසායන් ව්‍යාපාර වන අතර සියලු ව්‍යාපාර ව්‍යවසායන් නොවේ පැහැදිලි කරන්න.

(ආ) ව්‍යවසායකත්වයේ නව ප්‍රවනතාවයක් වනුයේ හරිත ව්‍යවසායකත්වයයි. මෙය පැහැදිලි කොට මෙහි වැදගත්කම සඳහන් කරන්න.

(ii) (අ) රජයේ මුද්‍රණාලයේ වසර 10 ක සිට සේවය කරන වාණිජ අංශයෙන් උසස් පෙළ සමත් ජයශාන්ත විවිධ වසර වලදී නව නිපැයුම් තරඟවලදී ජය ලබා ඇත. ඔහු විනෝදාංශයක් ලෙස චිත්‍ර කලාවේ යෙදේ. සමාජය තුළ පැන නගින විවිධ තත්වයන් හිදී සංවේදී වන ඔහු තම දෙමාපියන් හෝ පවුලේ කිසිඳු සාමාජිකයෙකු ව්‍යාපාර නොකරන නිසා ඔහුව ද ව්‍යාපාර කළ නොහැකි යයි කනස්සල්ලෙන් සිටී.

මෙම සිද්ධිය ඇසුරින් ඔහුට පැන නැගී ඇති ගැටළුවට ඔබ ඉදිරිපත් කරන විසඳුම දක්වන්න.

(ආ) ආරම්භ කරන බොහෝමයක් කුඩා ව්‍යාපාර අසාර්ථක වේ. එයට බලපා ඇති හේතු සඳහන් කරන්න.

(iii) (අ) අප රට තුළ භාණ්ඩ හා සේවා මිළදී ගැනීම සඳහා විවිධ විද්‍යුත් මුදල් වර්ග හඳුන්වා දුන්නද එය තවමත් භාවිතා කරන්නේ සීමිත පිරිසක් පමණි. එයට බලපාන ලද හේතු සඳහන් කරන්න.

(ආ) අප රට තුළ ව්‍යාපාරවල ක්‍රියාකාරීත්වයට බලපත්‍රලාභී විශේෂිත බැංකු දායකවන ආකාරය ඉදිරිපත් කරන්න.

(iv) (අ) චෙක්පතක් අණ කිරීම යන්න හඳුන්වා චෙක්පතක් අණකිරීමේදී ජංගම ගිණුම් හිමියෙකු සැලකිලිමත් විය යුතු කරුණු දෙකක් සඳහන් කරන්න.

(ආ) දේශීය ආනයන කරුවෙකුට ණයවර ලිපියක් වැදගත් වන්නේ ඇයිදැයි පැහැදිලි කරන්න.

(v) (අ) යම් රටක් තුළ දේශීය මුදලේ විදේශීය අගය පිරිහුනහොත් එම රට තුළ ඇති විය හැකි ආර්ථික ප්‍රතිවිපාක මොනවාදැයි දක්වන්න.

(ආ) වෙළෙඳපොළට අලුතින් පිවිසි කුඩා ව්‍යාපාරිකයෙකු වාණිජ පත්‍රිකා නිකුත් කිරීම තුළින් අරමුදල් එක්රැස් කර ගැනීමට අපේක්ෂා කරයි. මෙය කොතෙක් දුරට සාර්ථක වේදැයි ඔබගේ අදහස් දක්වන්න.

(4) (i) (අ) "රක්ෂණයේදී ආදේශන මූලධර්මය මගින් රක්ෂිකයන්ට අයුතු ලාභ ලබා ගැනීමට ඇති අවස්ථා මගහරවා ඇත." මෙය සත්‍යද අසත්‍යද යන්න දක්වා ඊට පක්ෂව කරුණු දක්වන්න.

(ආ) ශ්‍රී ලංකාවේ රක්ෂණ වෙළෙඳපොළ තුළ වාණිජ අංශයෙන් උසස්පෙළ හැදෑරූ ඔබටත් රැකියා අවස්ථා උදාකර ගත හැක. එය කුමන තත්වයන් තුළ දැයි දක්වන්න.

(ii) අප පාසල විසින් 2018 ජූලි 30 වන දින සියලුම ගුරු මහත්ම මහත්මීන් සඳහා පුහුණු වැඩසටහනක් පවත්වන බවත් ඒ සඳහා සියළුම අංශවල සියලුම ගුරු මහත්ම මහත්මීන් සහභාගී කරවන ලෙස විදුහල්පතිතුමා විසින් ලිපියක් මගින් සියලුම අංශ ප්‍රධානීන් දැනුවත් කළ අතර අංශ ප්‍රධානීන් ඒ අනුව තම අංශයේ ගුරු මණ්ඩලය ඒ පිළිබඳව දැනුවත් කොට අවශ්‍ය කටයුතු සූදානම් කළ බව විදුහල්පති තුමා වෙත S.M.S. පණිවිඩයක් මගින් දැනුවත් කරන ලදී.

(අ) ඉහත සිද්ධිය අධ්‍යයනය කොට සන්නිවේදන මූලිකාංග නම් කර එම සිද්ධිය ඇසුරින් උදාහරන දක්වන්න.

(ආ) රටක් තුළ සඵලදායී සන්නිවේදනයක් පවත්වාගෙන යාම සඳහා රජයකට ගතහැකි ක්‍රියාමාර්ග මොනවාද?

(iii) (අ) ජාත්‍යන්තර වෙළඳාමේදී භාණ්ඩ ප්‍රවාහනය සඳහා බහුලවම භාවිත කරන්නේ ජල මාර්ග ප්‍රවාහනයයි. එයට බලපාන ලද හේතු සඳහන් කරන්න.

(ආ) රටක ආර්ථික සංවර්ධනය සඳහා කාර්‍යක්ෂම ප්‍රවාහන පද්ධතියක් ඉතා වැදගත් වේ. මෙය තහවුරු කිරීමට කරුණු 4 ක් ඉදිරිපත් කරන්න.

(iv) (අ) පාරිභෝගික භාණ්ඩ සියල්ල බෙදාහැරීම සඳහා ඍජු බෙදාහැරීම භාවිතා කිරීම තුළින් පිරිවැය අඩුකොට භාණ්ඩ මිල අඩු කළ හැකි යැයි වෙළෙඳ ඇමතිවරයා ප්‍රකාශ කරයි. මෙයට ඔබ එකඟ වන්නේද නැද්ද යන්න දක්වා එය පැහැදිලි කරන්න.

(ආ) රටක් විදේශ වෙළෙඳාමේ නිරතවීමෙන් අත්කර ගත හැකි ප්‍රතිලාභ 4 ක් සඳහන් කරන්න.

(v) විදේශීය වෙළෙඳාමේදී භාවිතා වන පහත සඳහන් ලියකියවිලි වලින් අපේක්ෂා කරන්නේ කුමක්දැයි කෙටියෙන් දක්වන්න.

(අ) ප්‍රභවස්ථාන සහතිකය

(ආ) ණයවර ලිපිය

(ඇ) ආනයන සටහන්කරය

(ඈ) හානි රක්ෂණ ලිපිය

## II කොටස

(5) (i) කළමනාකරණ ක්‍රියාවලියක් තුළ යෙදවුම් කාර්යක්ෂමතාවයෙන් යුතුව භාවිතා කළ විට අරමුණ හා පරමාර්ථ සඵලදායකත්වයෙන් යුතුව ඉටුකර ගත හැක. මේ අනුව,

(අ) කාර්යක්ෂමතාවය හා සඵලදායකත්වය හඳුන්වන්න.

(ආ) හෙන්රි මින්ස්බර්ග් ට අනුව කළමනාකරුවෙකු විසින් ඉටු කරනු ලබන තොරතුරු භූමිකා නම් කොට ඊට උදාහරණ දක්වන්න.

(ii) (අ) ඔබ සිදු කරන සියලු කාර්යයන්හිදී තීරණ ගැනීමට ඔබට සිදු වේ. ඒ අනුව තීරණ ගැනීමේදී ඔබ අනුගමනය කළ යුතු පියවරයන් නම් කරන්න.

(ආ) අධිකාරිය හා බලය යන්න හඳුන්වා කළමණාකරුවෙකුට බලය ලබාගත හැකි මූලාශ්‍ර 4 ක් නම් කරන්න.

(iii) (අ) විදුහල්පතිතුමා ඇතුළු කළමනාකරණ මණ්ඩලය අප පාසල පාලනය කරයි. මින් අදහස් කරන්නේ කුමක්ද?

(ආ) අප පාසල තුළ සන්නිවේදනය සිදුවන පහත සඳහන් අවස්ථා සඳහා උදාහරනය බැගින් දක්වන්න.

★ සිරස් සන්නිවේදනය

★ තිරස් සන්නිවේදනය

★ අවිධිමත් සන්නිවේදනය

(iv) (අ) නිමි ඇඳුම් කර්මාන්තකරුවෙකු දිගින් දිගටම පාඩු ලැබීම නිසා ලැබෙන ඇණවුම් මත පමණක් නිමි ඇඳුම් නිෂ්පාදනය කිරීමට තීරණය කරන ලදි.
මෙහි දැකිය හැකි හිතකර ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

(ආ) කාර්යක්ෂමතාවය මැනීමේ වැදගත් මිනුමක් වනුයේ ඵලදායීතාවයයි. යම් නිෂ්පාදන ආයතනයක ඵලදායීතාවය 1 කට අඩුනම් එය වර්ධනය කර ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග 4 ක් සඳහන් කරන්න.

(v) (අ) වෙළෙඳපොළක් තුළ ඔබගෙන් යමෙකු භාණ්ඩයක ගුණත්වය පිළිබඳ විමසුව හොත් එම භාණ්ඩයේ ගුණත්වය හොඳ යැයි තීරණය කරනුයේ කුමන කරුණු සලකා බැලීමෙන් අනතුරුවද? එම සලකා බලන කරුණු සඳහන් කරන්න.

(ආ) අප පාසලේ කලා සහ වාණිජ අංශය සඳහා මනා මෙහෙයුම් පිරියත සැලැස්මක් පිළියෙළ කිරීම මගින් පාසලට අත්කර ගත හැකි වාසි 4 ක් ලියන්න.

(6) (i) (අ) වෙළෙඳපොළක් තුළ හුවමාරු සම්බන්ධතාවයක් ගොඩනැගීම සඳහා සපුරා ලියයුතු කොන්දේසි 4 ක් නම් කරන්න.

(ආ) විෂම ගති ලක්ෂණ යුක්ත වූ සමස්ථ වෙළෙඳපොළ සමජාතීය ගති ලක්ෂණ වලින් යුක්ත වූ කණ්ඩායම්වලට බෙදා වෙන් කිරීමකදී උපයෝගී කරගන්නා සාධක 4 ක් නම් කරන්න.

(ii) (අ) සේවා අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍යයක් වන මිනිසුන් යන්නෙහි ඇති වැදගත්කම කුමක්ද?

(ආ) නිෂ්පාදිතයක් සඳහා පිරිවැය අධික උවද ප්‍රාථමික, ද්වීතික, තෘතීක යනුවෙන් ඇසුරුම් යොදනු දැකිය හැක. එවැනි ඇසුරුම් වර්ග කීපයක් යෙදීමට බලපාන ලද කරුණු වෙන වෙනම සඳහන් කරන්න.

(iii) (අ) භාණ්ඩයක මිල ලකුණු කිරීමේදී නිෂ්පාදකයින් විවිධ අරමුණු මත පදනම් වෙමින් එය සිදු කරයි. එවැනි අරමුණු 4 ක් ඉදිරිපත් කරන්න.

(ආ) ප්‍රවර්ධන හා විකුණුම් ප්‍රවර්ධනය යන්න සංකල්ප දෙකක් නොව එකකි. මෙය සත්‍යද අසත්‍යද යන්න දක්වා පැහැදිලි කරන්න.

(iv) (අ) ව්‍යාපාරයක් මූල්‍ය කළමනාකරණයේදී අපේක්ෂා කරන ප්‍රධාන අරමුණු 2 ක් වනුයේ ලාභය උපරිම කිරීම හා කොටසක ඉපයුම උපරිම කිරීමයි. ව්‍යාපාරයක් මින් අපේක්ෂා කරන්නේ කුමක්දැයි වෙන වෙනම දක්වන්න.

(ආ) ව්‍යාපාරයක් විසින් පිළියෙළ කරන මුදල් අයවැය ලේඛනයකින් ව්‍යාපාරයට ලැබෙන ප්‍රයෝජන 2 ක් ලියන්න.

(v) (අ) මූල්‍ය කළමනාකරුවෙකු ගනු ලබන ප්‍රාග්ධන අයවැයකරණ තීරණ 2 ක් නම් කරන්න.

(ආ) ව්‍යාපාරයකට ලබාගත හැකි වක්‍ර මූල්‍ය සම්පාදන මාර්ග 4 ක් දක්වන්න.

(7) (i) (අ) ව්‍යාපාරයක් සඳහා යොදනු ලබන යෙදවුම් අතරේ මානව සම්පත සුවිශේෂී වූ සම්පතකි. මෙයට හේතු දක්වන්න.

(ආ) මානව සම්පත් කළමනාකරණය යටතේ එය මනා ලෙස සැපයුම්කරණය මගින් ආයතනයකට අත්කර ගත හැකි ප්‍රයෝජන 4 ක් සඳහන් කරන්න.

(ii) (අ) ආයතනයකට අලුතින් බඳවාගත් සේවකයෙකු අනුස්ථාපනය කිරීම සඳහා භාවිතා කළ හැකි ක්‍රම 4 ක් නම් කරන්න.

(ආ) කාර්යඵල ඇගයීමේ ක්‍රියාවලියක් තුළින් සේවා යෝජකයෙකුට අත්කර ගත හැකි ප්‍රතිලාභ මොනවාද?

(iii) (අ) ආයතනයක් තුළ යහපත් ශ්‍රමික සම්බන්ධතාවයක් ගොඩනගා ගැනීමට සේව්‍ය, සේවක දෙපාර්ශවයම උනන්දු විය යුතුය. එවැනි යහපත් ශ්‍රමික සම්බන්ධතා මගින් ආයතනයකට හිමිවන වාසි 4 ක් නම් කරන්න.

(ආ) වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයක් වන අකුරට වැඩ කිරීම සහ සංකේත වැඩවර්ජන යන්න හඳුන්වන්න.

(iv) (අ) කොටස් වෙළෙඳපොළේ හුවමාරු වන විවිධ සුරැකුම්පත් වල ආයෝජනය කිරීමෙන් එම ආයෝජකයින්ට හිමිවන ප්‍රතිලාභ 4 ක් නම් කරන්න.

(ආ) මුදල් වෙළෙඳපොළ තුළ ක්‍රියාත්මක වන අන්තර් බැංකු ඒක්ෂණ ණය වෙළෙඳපොළ යන්න හඳුන්වන්න.

(v) (අ) ඕනෑම සංවිධානයකට තොරතුරු ඉතා වැදගත් යෙදවුමකි. මේ අනුව දත්ත ප්‍රයෝජනයට ගත හැකි ආකාරයට සකස් කළ විට එය තොරතුරු බවට පත්වේ. මේ අනුව දත්ත හා තොරතුරු අතර දැකිය හැකි වෙනස්කම් 4 ක් ලියා දක්වන්න.

(ආ) භාවිතා කරන මට්ටම් අනුව දැනුම් මට්ටමේ තොරතුරු පද්ධති යටතේ සේවකයින් වර්ග දෙකකි. එම සේවකයින් වර්ග දෙක හඳුන්වා ඔවුන් භාවිතා කරන තොරතුරු දක්වන්න.

(8) (i) (අ) විද්‍යුත් තොරතුරු පද්ධතියක් උපාංග සමූහයක එකතුවකි. මෙහි ක්‍රියාපටිපාටි යන්න පැහැදිලි කරන්න.

(ආ) භාවිතය අනුව තොරතුරු පද්ධති වර්ගීකරණයේදී ගණුදෙනු සැකසුම් පද්ධති මගින් කුමන දත්ත සැකසීමක් සිදු කරනු ලබයිද යන්න දක්වන්න.

(ii) (අ) තොරතුරු තාක්ෂණය භාවිතය නිසා ව්‍යාපාර ආයතනවලට හිමිවන ප්‍රථිලාභ සඳහන් කරන්න.

(ආ) භූගෝලීය ව්‍යාප්තිය අනුව පරිගණක ජාල වර්ග කොට එය කෙටියෙන් හඳුන්වන්න.

(iii) (අ) ව්‍යාපාර සැලසුමක් පිළියෙළ කරන අවස්ථා 4 ක් නම් කරන්න.

(ආ) ව්‍යාපාර සැලසුමක් තුළ අඩංගු විධායක සාරාංශයක් ව්‍යාපාරය පිළිබඳ අවධානය යොමු කරන බාහිර පාර්ශවයන්ට වැදගත් වන අවස්ථා මොනවාද?

(iv) (අ) ඔබ විසින් සකස් කරන ව්‍යාපාර සැලසුමක් තුළ මෙහෙයුම් සැලැස්මේ අන්තර්ගත කරන කරුණු මොනවාද?

(ආ) ව්‍යාපාරයක් විසින් අලෙවි සැලැස්මක් සකස් කිරීමේදී ''තරඟකාරීත්ව විශ්ලේෂණයක් සිදු කළ යුතුය'' එහිදී සලකා බලන කරුණු මොනවාද?

(v) යම් ව්‍යාපාරිකයෙකු විසින් තීරණය කරන ලද ව්‍යාපාර අවස්ථාවක් වෙනුවෙන් ව්‍යාපාර සැලැස්මක් සකස් කරන ලෙස ඔබට පැවරුණ ලැබුව හොත් එහි ඇතුළත් කරන අංගවලට අමතරව ඔබ ඒ කෙරෙහි විශේෂ සැලකිල්ලක් යොමු කරනු ලබන කරුණු 8 ක් සඳහන් කරන්න.